හැඳින්වීම

ඓතිහාසික වශයෙන් මෙන්ම පාරිසරික වශයෙන් ද ඉතා වැදගත් ස්ථානයක් උසුලන බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ අගලවත්ත මැතිවරණ කොට්ඨාසයේ දකුණු පළාත් සීමාවට යාබදව පිහිටා ඇති වලල්ලාවිට ප්‍රදේශය ලේකම් කොට්ඨාසය ග්‍රාම නිලධාරී වසම් 60 කින් සමන්විත විශාලතම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයයි.

844 - E කටුකැලේ - වැල්මිගොඩ ග්‍රාම නිළධාරී වසම වලල්ලාවිට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ පිහිටි ග්‍රාම නිලධාරී වසම් හැට අතුරින් සුවිශේෂී වූවකි. මෙම ග්‍රාම නිලධාරී වසමෙහි පිහිටීම ගත් කල,

උතුරට :- 844 - A බෝතලාව ග්‍රාම නිලධාරී වසම

දකුණ :- 850 පැලවත්ත සහ 850 - D පැලවත්ත බටහිර උතුර ග්‍රාම නිලධාරී වසමද

නැගෙනහිර :- 843 - I රනේපුරගොඩ ග්‍රාම නිලධාරී වසමද

බස්නාහිර :- 849 - E කුම්බදූව ග්‍රාම නිලධාරී වසමද

මායිම් වන 844 - E කටුකැලේ - වැල්මීගොඩ ග්‍රා නිලධාරී බල ප්‍රදේශය කඳු ගැට, ඇළදොළ කෙත්වතු වලින් සපිරි ඉතාමත් රමණීය මෙන්ම සශ්‍රීක භූමිභාගයකි.

එසේම මෙම 844 - E කටුකැලේ වැලම්ගොඩ ග්‍රාම නිලධාරී වසම

1. කටුකැලේ
2. කපුවැල්ල
3. වැල්මීගොඩ
4. බෝතලව (කොටසක්)

යන ග්‍රාම හතරෙහි එකතුවකින් සැදුනකි.

වසමෙහි නම සෑදුනු ආකාරය

මෙම වසමෙහි නම සෑදුනු ආකාරය පිළිබඳ විමසා බැලූ කල වසමෙහි නම වර්තමානය වන විට කටුකැළේ වැල්මීගොඩ ලෙස එක් ග්‍රාම නිළධාරී කොටසක් ලෙස පැවතියද, මෙය කටුකැළේ සහ වැල්මීගොඩ ලෙස ප්‍රදේශ දෙකක් ලෙස පැවති ආකාරය අතීතයේ විමසා බලන විට දැක ගත හැක.

කටුකැළේ

බර්ගර් ජාතීන් විසින් අක්කර 214 ක පමණ රබර් වත්තක් පවත්වාගෙන යනු ලැබිණි. ප්‍රදේශයේ ජනතාව මෙම රබර් වත්තේ සේවය කල අතර, ඔවුන්ගේ ප්‍රධාන ආදායම් මාර්ගය (රැකියාව) වූයේ එහි සේවය කිරීමයි. මෙම රබර් වත්ත කටුකැළේ ලෙස අතීතයේ හඳුන්වා ඇති අතර, පසුකාලීනව මෙම අක්කර 214 ක රබර් වවන ලද භූමි ප්‍රමාණය අක්කර 50 දක්වා අඩු වී ක්‍රමයෙන් ජනාවාස ප්‍රදේශයක් බවට පත්විය. මෙම ප්‍රදේශයේ අද වන විට රබර් වගාව පවතින අතර, කටුකැළේ ලෙස ගොඩ නැගී ආ නාමය එලෙසින්ම පවතී.

වැල්මීගොඩ

වැල්මීගොඩ යන නාමය ගොඩ නැගුණු ආකාරය විමසා බලන විට දැක ගත හැකි වන්නේ අන්නාසිගලහේන නම් ප්‍රදේශයේ මිනිරන් පතල් වැඩට පැමිණි පිරිසක් විසින් මෙම ප්‍රදේශයේ වැල් මී බොහෝමයක් තිබෙනු දැක මෙම ප්‍රදේශය වැල්මීගොඩ ලෙසින් හඳුන්වනු ලැබිණි. (1800 වර්ෂයේ පැවති මෙම මිනිරන් පතලේ අයිතිකරු හෙන්රි ෆෙඩ්රික් නම් විය). එසේම මෙම ප්‍රදේශයේ අනෙකුත් ග්‍රාම සේවා වසම් හා සසඳන කල එකම වැල් මී බහුලව පැවති ගොඩැල්ල පසුව වැල්මීගොඩ ලෙස නම්වර ලද ආකාරය දැක ගත හැක.

මේ ආකාරයෙන් අද වන විට 844/ඊ කටුකැළේ වැල්මීගොඩ යන ග්‍රාම නිලධාරී වසමෙහි නාමය දෙයංශයක් ලෙස (කටුකැළේ - වැල්මීගොඩ) ගොඩ නැගී ඇති ආකාරයත් අද වන විට එකම නාමයක් යටතේ පවතින ආකාරයත් ඉතාමත් සවිස්තරාත්මකව ඉහත ආකාරයෙන් පෙන්වා දිය හැක.

වසමෙහි ඓතිහාසික වැදගත්කම

ඓතිහාසික අතින් 844 E කටුකැලේ ග්‍රාම නිලධාරී වසම ඉහත සඳහන් කළ ආකාරයට සුවිශේෂී ලෙසින් මෙහි නම ද ගොඩ නැගුනු අතර අද වන විට මෙම ප්‍රාදේශය පිලිබඳ විවිධ ඓතිහාසික කතා පුවත් පැවති. ඒ අතර බොහෝ පැරැන්නන් (විහාරස්ථානයෙහි නායක ස්වාමීන් වහන්සේලා) ප්‍රකාශ කරනු ලබන්නේ අතීතයේ වීදිබණ්ඩාර කුමාරයා තම සේනාව සංවිධානය කිරීම සඳහා මෙම ප්‍රදේශය තෝරා ගෙන ඇති බවත්, වීදිය බණ්ඩාර කුමාරයාගේ සහ පිරිවර අතර සිටි ඉතාමත් භක්තිමත්, සැදැහැවත් උපාසක කෙනෙකු දෙවි කෙනෙකු වී මේ ගමත් ජනතාවත්, වෙහෙර විහාරත් ආරක්ෂා කරන බවත් මෙම දෙවියන් ''ගුණෝෂ්වර'' නම් වන අතර මෙම දෙවියන් තුළ සුවිශේෂී බලයකින් හෙබි අයෙකු බව විශ්වාස කරති.

මෙම ගමෙහි පිහිටීම පිලිබඳව සුවිශේෂී කරුණක් වන්නේ මෙම ප්‍රදේශයේ පිහිටි එක් කඳු මුදුනක වර්ග ප්‍රමාණය අක්කර 4 1/2 ක් පමන වන කළුගලක් පිහිටා තිබීමයි. කඳු මුදුන පුරාවටම තනි කළුගලක් දිස්වීම විශේෂතාවයයි.

මෙම කන්ද ''වටාගල කන්ද'' ලෙස හඳුන්වනු ලබන අතර මෙම කඳු මුදුනේ අතීතයේ විශාල නිධානයක් තැම්පත් කොට ඇති බවට විශ්වාස කෙරේ. මෙම නිධානය ආරක්ෂා කරන වටාගල දෙවියන් පෙර සඳහන් කළ ගුණෝෂ්වර දෙවියන් බව ගම් වාසිහු විශ්වාස කෙරේ. මේ ආකාරයෙන්ම මෙම වසමෙහි ඓතාහාසිකමය වැදගත්කම සහ විකාශය පෙන්වා දිය හැක.

වසමට ප්‍රවේශවන ගමන් මාර්ගය

844 - E කටුකැලේ වැල්මීගොඩ ග්‍රාම නිලධාරි වසමට ප්‍රවේශවන මාර්ගයන් විස්තර කිරීමේදී ප්‍රධාන මාර්ගය හා අතුරු මාර්ගය ලෙසින් දෙයාකාරයකින් ප්‍රවේශ විය හැක.

❖ ප්‍රධාන ප්‍රවේශ මාර්ගය :-

මෙම වසම පෞද්ගලික රථයකින් හෝ පොදු ප්‍රවාහන මාධ්‍ය මඟින් (බස් රථ) වසමට පැමිණෙන්නේ නම් මතුගම - පැලවත්ත ප්‍රධාන මාර්ගයේ පැලවත්ත නගරයේ සිට මතුගම දෙසට 4 km ක් නැතහොත් මතුගම නගරයේ සිට පැලවත්ත නගරයට ගමන් කරන මාර්ගයේ සිට 21 km ක් ගමන් කළ විට කුම්බදූව හංදිය අසලින් (බසයෙන් නම් කුම්බදූව හංදියෙන් බැස) බෝතලාව විහාරස්ථානයට ගමන් කරන මාර්ගයේ ගිය විට ඔබට මෙම වසමට ප්‍රවේශ විය හැක. කුම්බදූව හංදියේ කොටසක් සහ ඔබ ගමන් කරන බෝතලාව විහාරස්ථාන මාර්ගයේ දකුණු පස කොටසද මේ වසමට අදාල වේ. (මෙම විහාරස්ථාන මාර්ගයේ ගිය විට වසමෙහි ග්‍රාම නිලධාරි, සංවර්ධන නිලධාරි කෘෂි පර්යේෂන නිලධාරි සහ සමෘද්ධි සංවර්ධන නිලධාරි යන නිලධාරින්ගේ කාර්යාල වෙත පහසුවෙන් සහ කෙටිම ගමන් මාර්ගය වේ)

❖ අතුරු ප්‍රවේශ මාර්ගය

මෙම වසමට පහසුවෙන්ම ලඟාවිය හැකි තවත් අතුරු එක් ප්‍රවේශ මාර්ගයක් නම් පැලවත්ත නගරයේ සිට කළුගල බදුරලිය මාර්ගයේ 2 1/2 Km ක් පමණ ගොස් රනේපුරගොඩ ප්‍රදේශයට (රනේපුරගොඩ පාසලට යන මාර්ගය) වම් පස මාර්ගය දිගේ ගමන් කල විට ප්‍රථමයෙන් ඇති කුඩා මංසංදියෙන් වමට ගිය විට මෙම 844 - E කටුකැලේ වැල්මීගොඩ ග්‍රාම නිලධාරි වසමට ප්‍රවේශ විය හැක.

සුවිශේෂී ස්ථානයන්

- වටාගල කන්ද
- එක් පසෙකින් කළුගල රක්ෂිත වනාන්තරය (පාරිසරික වශයෙන් සුවිශේෂී වේ)

ආගමික ස්ථාන

- බෝතලාව ශ්‍රී බෙත්තාරාම විහාරස්ථානය
- වැල්මීගොඩ ශ්‍රී අභිනවාරාම විහාරස්ථානය
- ශ්‍රී ධර්ම විවේකාරාමය - කටුකැලේ

විහාරස්ථානයේ නම	නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ නම	ආරම්භ කල වර්ෂය	ස්වාමීන්ද්‍රයන් වහන්සේලා ගණන.	සම්හන්ධ කර ගත හැකි දුරකථන අංකය
බෝතලාව ශ්‍රීබෙත්තාරාම විහාරස්ථානය	පූජ්‍ය බෝතලාවේ සමිද්ධි සුමන හිමි	1889	13	0342284296
වැල්මීගොඩ ශ්‍රී අභිනවාරාම විහාරස්ථානය	පැබොටුවේ අරිය විමල හිමි	1943	04	0714448530
ශ්‍රී ධර්ම විවේකාරාමය - කටුකැලේ	මත්තක සුභාධර්ම	2015	මෙහෙනින් වහන්සේලා 01	0764114361

පාසැල්

පාසලේ නම	විද්‍යාලීය විදුහල්පති තුමියගේ නම	ආරම්භක වර්ෂය	සිසුන් ගණන	ගුරුවරු ගණන	සම්හන්ධ කර ගත හැකි දුරකථන අංකය
බෝතලාව කණිෂ්ඨ විද්‍යාලය	එස්. ඒ. චිත්‍රාංගනී මිය	1937	168	13	0711555267 0342284317



ශ්‍රී බෙත්තාරාම විහාරස්ථානය



ශ්‍රී අභිනවාරාම විහාරස්ථානය



ශ්‍රී ධර්ම විවේකාරාමය



බෝතලාව කනිෂ්ඨ විද්‍යාලය